දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය - Faculty of Humanities & Social Sciences

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) 2018 පරීක්ෂණය (2015 පුනර්) - 2018 සැප්තැම්බර්/ඔක්තෝබර්
First Examination in Arts (External) 2018 (Repeat 2015) – September/October 2018

දේවිප්‍ර 1.2 - ක්‍රි.ව. 1832 සිට ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය හා දේශපාලනය
PS 1.2 – Government and Politics of Sri Lanka Since 1832

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකිය

---

01. "1832 කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණය ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය හා දේශපාලන වශයෙන් විශාල පරිවර්තනයකට මුල පිරීය." විමසන්න.

02. ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය පහත සඳහන් ශීර්ෂ යටතේ සාකච්ඡා කරන්න.
    I. සම්භවය හා නායකත්වය
    II. අරමුණු, ක්‍රියාමාර්ග හා ලබාගත් ජයග්‍රහණ

03. 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ පහත සඳහන් ශීර්ෂ යටතේ විස්තර කරන්න.
    I. සර්වජන ඡන්දය හා පළාත්බද ඡන්ද ක්‍රමය
    II. රාජ්‍ය මන්ත්‍රණ සභාව හා විධායක කාරක සභා ක්‍රමය

04. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රමය මගින් සුළු ජාතීන්ගේ ආරක්ෂාව සඳහා ඇති කළ විධි විධාන පැහැදිලි කර ඒවා කොතරම් ප්‍රායෝගිකව සාර්ථක වී ද? විවේචනාත්මකව විග්‍රහ කරන්න.

05. 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වාදුන් නවාංග මොනවා ද? ඒවා කොතරම්දුරට සාර්ථක පාලනයකට ඉවහල් වූවා ද? සාකච්ඡා කරන්න.

06. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වාදුන් නවාංග මොනවා ද? ඒවා කොතරම් දුරට සාර්ථක වී ද? විභාග කරන්න.

07. ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රියාදාමය තුළ නව වාමාංශය ඉටුකරනු ලබන කාර්යභාරය පිළිබඳව තෘප්තිමත් විය හැකි ද? ඔබේ තක්සේරුව කුමක් ද? සාකච්ඡා කරන්න.

08. 2015 - 2018 වත්මන් ආණ්ඩුවේ විදේශ ප්‍රතිපත්තියේ මූලික ලක්ෂණ මොනවා ද? අරමුණු ඉටු වී තිබේ ද? විවේචනාත්මකව විග්‍රහ කරන්න.

09. උතුරු - නැගෙනහිර පළාතේ ද්‍රවිඩ ජනතාවගේ ඉල්ලීම් ලබාදීම සඳහා වත්මන් ආණ්ඩුව අනුගමනය කරමින් පවතින ක්‍රම උපායන් ජාතික ඒකාබද්ධතාවයට කොතරම් දුරට සාර්ථක වී ද? විමසන්න.

10. පහත සඳහන් මාතෘකා <u>දෙකක් (02)</u> පිළිබඳව සටහන් ලියන්න

- I. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය
- II. 2018 පළාත් පාලන මැතිවරණය
- III. වත්මන් පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ භූමිකාව
- IV. 2018 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අතුරු කමිටු වාර්තාව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීමේ උත්සාහය.